**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.05.13 |

එච්.එම්.එම්.ඩී. රුවන් (XP 21346)
අංක 436/2 සී, බුද්ධ ජයන්ති මාවත,
මාකොල උතුර, මාකොල.

*පැමිණිලි පාර්ශවය*

*එදිරිව*

නාවික හමුදාධිපති,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය.
කොළඹ

*වගඋත්තර පාර්ශවය*

**<u>පැමිණිලි අංකය: HRC/2960/25</u>**

**01. පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් 2025.09.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එමඟින්, පැමිණිලිකරු 1997 පෙබරවාරි 24 වන දින ශ්‍රී ලංකා නාවික හමුදා සේවයට බැඳී 2014 වර්ෂය දක්වා අඛණ්ඩව සේවයේ නිරත බවත්, 2014 වර්ෂයේදී බාලවයස්කාර දැරියකට ලිංගික අතවර කළ බවට එල්ල වූ සාපරාධී චෝදනාවක් මත කැකිරාව පොලිසිය විසින් ඔහුව අත්අඩංගුවට ගැනීමේ, සිදුවීම පදනම් කරගෙන එවකට සිටි නාවික හමුදාධිපතිවරයා විසින් 2014.11.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි "සේවය තවදුරටත් අවශ්‍ය නොවේ" යන පදනම මත ඔහුව සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

නමුත්, අදාළ චෝදනාව සම්බන්ධයෙන් අනුරාධපුර මහාධිකරණය හමුවේ (නඩු අංක: SHC 131/20) වසර 11 කට ආසන්න කාලයක් විභාග වූ නඩු කටයුත්ත අවසානයේ, 2025.06.25 වන දින පැමිණිලිකරු එම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට ගරු අධිකරණය නියෝග කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව තමා සිදු නොකළ වරදක් සම්බන්ධයෙන් පදනම් විරහිතව සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් තමාට අහිමි වූ විශ්‍රාම වැටුප් හිමිකම් සහ අනෙකුත් සේවා වරප්‍රසාද නැවත ලබා දෙන ලෙස පැමිණිලිකරු නාවික හමුදාවෙන් ඉල්ලීම් කර ඇතත්, එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇති බව සඳහන් කරමින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල යොමු කර ඇත .

නාවික හමුදාවේ වසර 17 කට අධික සිය සේවා කාලය සැලකිල්ලට ගෙන, අධිකරණය හමුවේ තමා නිවැරදිකරු ලෙස තහවුරු වී ඇති පසුබිමක තමාට හිමිවිය යුතු සාධාරණ සහනයන් ලබා ගැනීම මෙම පැමිණිල්ලේ සහනය වශයෙන් අපේක්ෂා කර ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.<br>இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04.<br>No. 14, R. A. De Mel Mawatha, Colombo 04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011 - 250 5451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 250 5541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 - 250 5521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

**02. වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම**

නාවික හමුදාධිපතිවරයා වෙනුවෙන් නීති අංශය විසින් 2025.12.15 දිනැති අංක එන්එච්කියු/ එල්ජී/ එච්ආර්සී/ ජීඑන්/ එස්/ 198/2025 දරන වාර්තාව මගින් කරුණු දක්වමින්, පැමිණිලිකරු නාවික හමුදා සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත්තේ 1950 නාවිකයන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසිවල 15(i)(xi)(a) රෙගුලාසිය ප්‍රකාරව 2014 නොවැම්බර් මස 06 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි "සේවය තවදුරටත් අවශ්‍ය නොවේ" (Services No Longer Required) යන පදනම මත බව දැනුම් දී ඇත. තව ද මෙලෙස නාවික හමුදාධිපතිවරයාගේ අභිමතය පරිදි සේවයෙන් ඉවත් කරන ලද නාවිකයෙකු නැවත සේවයට බඳවා ගැනීමට හෝ ඔහුට විශ්‍රාම වැටුපක් ලබා දීමට පවතින නෛතික රාමුව තුළ කිසිදු ප්‍රතිපාදනයක් නාවික හමුදාව සතුව නොමැති බවත් වැඩිදුරටත් එහි සඳහන් කර ඇත.

එම වාර්තාවට ඇමුණුමක් ලෙස නාවික හමුදාධිපතිවරයා වෙනුවෙන් අධ්‍යක්ෂ නාවික පුද්ගල විසින් 2025.08.21 වන දින පැමිණිලිකරු වෙත යොමු කර ඇති, අංක එන්එච්කිව්/ ඩීඑන්පී/ ආර්යූඑන්/ ජීඑන්/21346/2025 දරන ලිපියේ පිටපතක් ඉදිරිපත් කර ඇත. එමගින් පැමිණිලිකරු සිදු කරන ලද අභියාචනය පිළිබඳව කරුණු දක්වමින් පෙන්වා දී ඇත්තේ, 1950 නාවිකයන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසි ප්‍රකාරව ඔහු නාවික හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් කර ඇති බැවින්, එවැනි පුද්ගලයෙකු නැවත සේවයෙහි පිහිටුවීමට හැකියාවක් නොමැති බවයි.

2026.01.22 වන දින කොමිෂන් සභාවේදී පවත්වන ලද විමර්ශනයේ දී නාවික හමුදාධිපතිවරයා වෙනුවෙන්, නීති නිලධාරි වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත. එහි දී, පැමිණිලිකරු 1997 පෙබරවාරි 24 වන දින නාවික හමුදාවට බැඳී ඇති බවත්, සේවයේ නිරතව සිටියදී 2014.10.10 වන දින කැකිරාව පොලිසියෙන් ලද පණිවිඩයක් පදනම් කරගෙන ඔහුව අදාළ පොලිස් ස්ථානය වෙත භාර දී ඇති බව සඳහන් කර ඇත. ඒ සඳහා රණජයපුර නිවාස සංකීර්ණයේ පදිංචි පුෂ්පා නිල්මිණි වනිගසේකර යන අය විසින් සිය අවුරුදු 5යි මාස 6ක් වයසැති දැරියට පැමිණිලිකරු විසින් බරපතල ලිංගික අතවර කළ බවට පොලීසිය වෙත කරන ලද පැමිණිල්ල ඊට පදනම වී ඇති බවත්, මෙම බරපතල චෝදනාව සැලකිල්ලට ගනිමින්, එවකට සිටි නාවික හමුදාධිපතිවරයා විසින් "සේවය තවදුරටත් අවශ්‍ය නොවේ" යන පදනම මත නාවික පොදු 051702 දරන සංඥාව මගින් 2014.11.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ සේවය අවසන් කිරීමට තීරණය කර ඇති බවට කරුණු දක්වා ඇත.

පැමිණිලිකරු සම්බන්ධයෙන් අනුරාධපුර මහාධිකරණයේ විභාග වූ අංක SHC 131/20 දරන නඩුවෙන් ඔහුව නිදොස් කොට නිදහස් කරමින් 2025.06.25 වන දින ලබා දුන් තීන්දුව පදනම් කරගෙන, ඔහු 2025.07.03 වන දින නාවික හමුදාවෙන් සහන ඉල්ලා ඇති බව ද වගඋත්තරකරු සඳහන් කර ඇත. එහෙත්, 2025.08.21 දින නාවික හමුදාධිපතිවරයා විසින් ලබා දුන් පිළිතුර සහ මේ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය කළ විමසීමට 2026.01.06 දින නාවික හමුදාව දුන් පිළිතුරු ලිපිය මගින් ද යළිත් අවධාරණය කර ඇත්තේ, නාවික හමුදාධිපතිවරයාගේ අභිමතය පරිදි සේවයෙන් ඉවත් කරන ලද පුද්ගලයෙකු නැවත සේවයේ පිහිටුවීමට නෛතික හැකියාවක් නොමැති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**03. නිරීක්ෂණ**

1. පැමිණිලිකරුට එරෙහිව එල්ල වූ සාපරාධී අපරාධ චෝදනාවට පාදක වූ සිදුවීම ඔහු නිවාඩු ලබා සිටි දිනයක සිදු වූවක් බවත්, වසර 11ක දීර්ඝ නඩු විභාගයකින් පසු අධිකරණය හමුවේ පූර්ණ නිදොස් කොට නිදහස් වී ඇති පසුබිමක නාවික හමුදාව ගෙන ඇති තීරණය අයුක්ති සහගත බවත් සඳහන් කර ඇත. 2014 වර්ෂයේ සිට 2025 දක්වා කාලය තුළ ඔහු අදාළ නඩුවට සම්බන්ධව සැකකරුවෙකු මට්ටමේ පමණක් පසුවූ බැවින්, තමා සේවයෙන් ස්ථිරවම ඉවත් කරනු වෙනුවට නඩු විභාගය අවසන් වන තෙක් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 27.9 වගන්තිය ප්‍රකාරව 'අනිවාර්ය නිවාඩු' ලබා දී සේවයේ රඳවා ගැනීමට නාවික හමුදාවට අවස්ථාව තිබූ බව ඔහු සඳහන් කර ඇත.

මෙහිදී පැමිණිලිකරු සිය කරුණු දැක්වීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන උපුටා දක්වා තිබුණ ද, ඔහු නාවික හමුදාවේ සාමාජිකයෙකු බැවින් සිවිල් රාජ්‍ය සේවකයන් සඳහා බලපාන ආයතන සංග්‍රහයේ රෙගුලාසි ඔහුට සෘජුව අදාළ නොවන බව නිරීක්ෂණය වේ.

2. පැමිණිලිකරු 2014.11.06 දින සේවයෙන් ඉවත් කිරීමට නාවික හමුදා පාලනාධිකාරිය පදනම් කරගෙන ඇත්තේ කැකිරාව පොලිසිය විසින් 2004.10.10 දින ඔහුට එරෙහිව ගොනු කරන ලද 'බරපතල ලිංගික අපයෝජන' චෝදනාවයි. වගඋත්තර නාවික හමුදාව සඳහන් කර ඇති පරිදි, එකී අපරාධ චෝදනාව පදනම් කරගෙන "සේවය තවදුරටත් අවශ්‍ය නොවේ" යන ස්ථාවරය මත ඔහුව ඉවත් කර ඇත. කෙසේ වුවද, අනුරාධපුර මහාධිකරණය විසින් ලබා දුන් අංක SHC 131/20 දරන නඩු තීන්දුව මඟින් පැමිණිලිකරු එම චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (5) මඟින් වරදකරු යැයි ඔප්පු කරන ලබන තෙක් සෑම තැනැත්තකුම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේය යයි සැලකේ.

තව ද නීතිමය මූලධර්මයන්ට අනුව පුද්ගලයෙකු අධිකරණයකින් නිදොස් වූ විට, එම වරද ඔහු විසින් සිදු නොකරන ලද බව නීතිය හමුවේ පිළිගැනේ. ඒ අනුව, පැමිණිලිකරු සේවයෙන් ඉවත් කිරීමට වගඋත්තරකරුවන් පාදක කරගත් 'සදාචාරාත්මක සහ නෛතික පදනම' වර්තමානය වන විට බිඳ වැටී ඇත.

3. මෙම සේවය අවසන් කිරීමේ තීරණයට පාදක වූ පොලිස් පැමිණිල්ල ලැබීමට ප්‍රථම, පැමිණිලිකරු වසර 17 කට අධික කාලසීමාවක් නාවික හමුදාවට අනුයුක්තව සේවය කළ නිත්‍ය නාවිකයෙකු වන අතර, එම දීර්ඝ සේවා කාලය තුළ ඔහුට එරෙහිව කිසිදු විනය විරෝධී කටයුත්තක් වාර්තා වී ඇති බවට නාවික හමුදාව කරුණු ඉදිරිපත් කර නොමැති බව ද බවත් පෙනී යයි. එවැනි දීර්ඝ සේවා ඉතිහාසයක් සහිත නාවිකයෙකුට එරෙහිව සාපරාධී අපරාධ චෝදනාවක් එල්ල වූ අවස්ථාවක, සාමාන්‍ය පරිදි නාවික හමුදාව විසින් සිදුකරනු ලබන ක්‍රමවේදය යටතේ, අදාළ නඩු විභාගය අවසන් වන තෙක් වැටුප් සහිතව හෝ අඩ වැටුප් සහිතව පැමිණිලිකරුගේ සේවය අත්හිටුවීමට නාවික හමුදාවට හැකියාව පැවතිණි. එසේ වුවද, පැමිණිලිකරු අදාළ චෝදනාව සම්බන්ධයෙන් අධිකරණය හමුවේ 'සැකකරුවෙකු' ලෙස පසුවෙද්දී, කිසිදු විධිමත් අභ්‍යන්තර විනය පරීක්ෂණයකින් හෝ කරුණු විමසීමකින් තොරව 2014.11. 06 දින සිට හදිසියේම ඔහුගේ සේවය අවසන් කිරීමට කටයුතු කිරීම තුළින්, තමාට එරෙහි චෝදනා වලට නිදහසට කරුණු දැක්වීමට පැමිණිලිකරුට තිබූ නෛතික අවස්ථාව අහිමි කර ඇති බව නිරීක්ෂණය වේ.

4. අනුරාධපුර මහාධිකරණය විසින් (නඩු අංක: SHC 131/20) 2025.06.25 දින ලබා දුන් නඩු තීන්දුව අනුව, වින්දිත දැරිය විසින් සිද්ධිය පිළිබඳව හෝ චූදිතයා (පැමිණිලිකරු) පිළිබඳව කිසිදු මතකයක් නොමැති බවත්, ඔහුව හඳුනාගත නොහැකි බවත් අධිකරණය හමුවේ සාක්ෂි ලබා දී ඇත. එසේම, දැරියගේ මව විසින් ලබා දුන් සාක්ෂිය හුදෙක් උපකල්පනයන් මත පදනම් වූවක් මිස ඇසින් දුටු සාක්ෂියක් නොවන බව ද අධිකරණය තීන්දු කර ඇත. ඒ අනුව, පැමිණිල්ලේ සාක්ෂි දුර්වල සහ පරස්පර විරෝධී වීම හේතුවෙන්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200(1) වගන්තිය ප්‍රකාරව විත්තිවාචකය නොකැඳවාම පැමිණිලිකරු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇත. මෙය හුදෙක් 'සැකයේ වාසිය' මත ලබා දුන් නිදහස් කිරීමක් නොව, පැමිණිලිකරු එම වරද සිදු නොකළ බවට නෛතිකව තහවුරු වූ නිදොස් කිරීමකි. එවැනි තත්ත්වයක් යටතේ ද, නාවික හමුදාව සිය පැරණි තීරණයෙහිම රැඳී සිටිමින් පැමිණිලිකරුට සහන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම යුක්ති සහගත නොවන අතර, එය වින්දිතයා වෙත එල්ල කරන ලද දඬුවමක් හා සමාන ක්‍රියාවක් බව නිරීක්ෂණය වේ.

5. නාවික හමුදාව 1950 නාවිකයන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසිවල 15(i)(xi)(a) රෙගුලාසිය යටතේ නාවික හමුදාධිපතිවරයාට ඕනෑම අයෙකුගේ සේවය අවසන් කිරීමට අභිමතයක් පවතින බව පවසමින් සිය බලය සාධාරණීකරණය කිරීමට උත්සාහ කරයි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විවිධ නඩු තීන්දුවලදී තහවුරු කර ඇති පරිදි, කිසිදු රාජ්‍ය නිලධාරියෙකු සතු 'අභිමතය' යන්න

නිරපේක්ෂ හෝ අසීමිත බලයක් නොවන අතර, එය නීතියේ පාලනයට යටත්ව සාධාරණ, තාර්කික සහ යුක්තිසහගත විය යුතුය.

6. වගඋත්තර නාවික හමුදාව සිය ක්‍රියාකලාපය සාධාරණීකරණය කිරීම සඳහා නාවික හමුදා රෙගුලාසි ඉදිරිපත් කළ ද, රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සලස්වා ඇති ආකාරයට හෝ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම සිදු නොකළ යුතුය යන්න 4(ඇ) ව්‍යවස්ථාවේ මගින් සඳහන් කර ඇත. ඒ අනුව එවැනි සීමාකිරීමක් හෝ අහිමි කිරීමක් සිදුකිරීමට නාවික හමුදා පනතට නෛතික බලයක් හිමි නොවේ. අධිකරණ නියෝගයකින් නිදොස් කොට නිදහස් කරන ලද පුද්ගලයෙකුට සහන සැලසීම සඳහා 'ප්‍රතිපාදන නොමැති' බව පැවසීම හුදු පරිපාලනමය මගහැරීමක් පමණක් වන අතර, එය කිසිසේත් යුක්තිය පසිඳලීමට බාධාවක් නොවිය යුතුය.

7. නාවික හමුදාව 1950 නාවිකයන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසිවල 15(i)(xi)(a) වගන්තිය ප්‍රකාරව නාවික හමුදාධිපතිවරයා සතු අභිමතය මත පැමිණිලිකරුගේ සේවය අවසන් කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් සහන සැලසීමට නෛතික පදනමක් නොමැති බවට දක්වන ස්ථාවරය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දු සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ මූලධර්මයන්ට පටහැනි වේ.

විශේෂයෙන්ම, ***පේදුරු ආරච්චිගේ ජානක පුෂ්පකුමාර එදිරිව නාවික හමුදාධිපති සහ තවත් අය [S.C. (F.R.) Application No. 452/2011]*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය, රාජ්‍ය නිලධාරියෙකු සතු කිසිදු අභිමත බලයක් 'අසීමිත' නොවන බවත්, එය සෑම විටම සාධාරණ හා තාර්කික විය යුතු බවත් සඳහන් කර ඇත. එම නඩුවේදී ජනක් ද සිල්වා විනිසුරුතුමා ඉතා පැහැදිලිව මෙසේ අවධාරණය කර ඇත.

> *"සෑම අභිමත බලයකටම සීමාවන් පවතී. සීමා රහිත හෝ අසීමිත අභිමතය යනුවෙන් දෙයක් නීතිය තුළ නොපවතී. එවැනි අසීමිත අභිමතයක් පැවතීම යනු අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම වන නීතියේ ආධිපත්‍යයට සහමුලින්ම පටහැනි වූවකි."*

මෙම මූලධර්මය තහවුරු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ***විසුවලිංගම් එදිරිව ලියනගේ [(1983) 1 Sri.L.R. 203]*** නඩුවේදී ලබා දුන් තීන්දුව ද උපයෝගී කරගෙන ඇත. එහිදී අධිකරණය සඳහන් කළේ විධායකයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී කිසිදු නිලධාරියෙකුට තම හිතුමතය පරිදි කටයුතු කළ නොහැකි බවත්, සෑම පරිපාලන තීරණයක්ම නීතියට හා තර්කයට අනුකූල විය යුතු බවත්ය. ***එසේම ප්‍රේමචන්ද්‍ර එදිරිව මේජර් මොන්ටේගු ජයවික්‍රම [(1994) 2 Sri.L.R. 90]*** නඩුවේදී ද තහවුරු වූයේ 'අභිමතය' යන වචනයෙන් අසීමිත බලයක් අදහස් නොවන බවත්, ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට පවරා ඇති බලයක් 'පොදු යහපත' සහ 'යුක්තිසහගතභාවය' මත පදනම් විය යුතු බවත්ය.

පැමිණිලිකරු සේවයෙන් ඉවත් කිරීමට පාදක වූ එකම හේතුව ඔහුට එරෙහිව පැවති අපරාධ චෝදනාවයි. වසර 11 ක නඩු විභාගයකින් පසු අනුරාධපුර මහාධිකරණය විසින් (නඩු අංක SHC 131/20) ඔහුව නිදොස් කොට නිදහස් කිරීමත් සමඟ, නාවික හමුදාව සිය අභිමතය භාවිතා කිරීමට පාදක කරගත් නෛතික හේතුව අහෝසි වී ඇත. මෙවැනි පසුබිමක, පුද්ගලයෙකු අධිකරණයකින් නිදොස් වූ පසුත් "ප්‍රතිපාදන නැත" යන පටු පරිපාලනමය හේතුව මත ඔහුට හිමිවිය යුතු විශ්‍රාම වැටුප් වරප්‍රසාද අහිමි කිරීම ඉහත සඳහන් **SC FR 452/2011** තීන්දුව ප්‍රකාරව අත්තනෝමතික ක්‍රියාවකි.

***D.S.R. Weerakoon vs Lt. Gen. A.W.J.C De Silva [CA/WRIT/382/2015]*** නඩු තීන්දුව මගින් තහවුරු කර ඇති පරිදි, කිසිදු හමුදා බලධාරියෙකුට හෝ මණ්ඩලයකට තමා වෙත පැවරී ඇති නීත්‍යානුකූල බල සීමාවෙන් ඔබ්බට ගොස් පුද්ගලයෙකුගේ සේවය අවසන් කිරීමට හෝ වරප්‍රසාද අහිමි කිරීමට නෛතික බලයක් නොමැත. එම නඩුවේදී අධිකරණය පෙන්වා දුන්නේ, යම් පුද්ගලයෙකුට එරෙහිව පූර්වයෙන්

විමර්ශනය කර අවසන් වූ හෝ නිරාකරණය වූ කරුණු නැවත වරක් එම පුද්ගලයාව සේවයෙන් ඉවත් කිරීමට හෝ ඔහුට අගතියක් සිදු කිරීමට පදනම් කරගත නොහැකි බවයි.

අභියාචනාධිකරණය විසින් විභාග කරන ලද **CA/WRIT/171/2016** නඩුවේදී විනිසුරු මහින්ද සමයවර්ධන මහතා පෙන්වා දුන් පරිදි, පරිපාලන තීරණයකදී ගනු ලබන නීත්‍යානුකූල නොවන පියවරයන් පුද්ගලයෙකුගේ සමස්ත ජීවිතයටම කණගාටුදායක බලපෑමක් ඇති කරයි. එහිදී ***Roberts Vs Hopwood (1925) AC 578 at 613*** නඩු තීන්දුව උපුටා දක්වමින් අභිමතය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත.

*"අභිමත බලයක් හිමි පුද්ගලයෙකු එම බලය භාවිතා කළ යුත්තේ සාධාරණ පදනමක් (Reasonable grounds) මතය. අභිමතය යනු පුද්ගලයෙකුට හුදෙක් තමාට රිසි දේ කිරීමට ලබා දෙන බලයක් නොවේ. ඔහු සිය අභිමතය භාවිතා කළ යුත්තේ තමාට අවශ්‍ය දේ කිරීමට නොව, තමා විසින් කළ යුතු (what he ought) දේ කිරීමටය. වෙනත් වචනවලින් පවසන්නේ නම්, ඔහු තර්කානුකූල විය යුතු අතර තර්කය මගින් පෙන්වා දෙන මාවත අනුගමනය කළ යුතුය. ඔහු සෑම විටම සාධාරණව ක්‍රියා කළ යුතුය."*

ඉහත **CA/WRIT/171/2016** නඩු තීන්දුවට අනුව, "සේවයෙන් ඉවත් කිරීම යනු බරපතල දඬුවමකි". එමෙන්ම, "දඬුවම පුද්ගලයා සිදු කළ වරදට සමානුපාතික විය යුතුය". පැමිණිලිකරු සැබවින්ම වරදක් කර ඇති බවට කිසිදු විධිමත් පරීක්ෂණයකින් තහවුරු නොවූ පසුබිමක, හුදෙක් පොලිස් පැමිණිල්ලක් මත පමණක් පදනම්ව ඔහු සේවයෙන් පහ කිරීම දඬුවම් කිරීමේ ස්වභාවය සහ වරදෙහි ස්වභාවය අතර පවතින සමානුපාතික බව බිඳ දැමීමකි.

අභියාචනාධිකරණයේ **CA/WRIT/107/2016** (ගුවන් හමුදාවට එරෙහිව) නඩුවේදී ද අවධාරණය කර ඇත්තේ, සේවයෙන් ඉවත් කිරීමක් සිදු කිරීමේදී පවතින නෛතික තත්ත්වයන් පිළිබඳව දීර්ඝ අධ්‍යයනයක් සහ විධිමත් පටිපාටියක් අනුගමනය කළ යුතු බවයි. එසේම **<u>ගොඩගේ එදිරිව කහවත්ත (1992 SLR 54)</u>** නඩු තීන්දුව මගින් තහවුරු කර ඇත්තේ, නිසි චෝදනා පත්‍රයක් නිකුත් කිරීමකින් තොරව පුද්ගලයෙකු වරදකරු කළ නොහැකි බවයි.

මෙම පැමිණිලිකරුට එරෙහිව නාවික හමුදා නීතිය මූලික පරීක්ෂණ මණ්ඩලයකින් පසුව නිසි චෝදනා පත්‍රයක් පවා නිකුත් කර නොමැත. මෙලෙස පැමිණිලිකරුට සිය නිදහසට කරුණු දැක්වීමට හෝ ඔහුට සවන් දීමට අවස්ථාවක් ලබා නොදී සේවය අවසන් කිරීම, නාවික හමුදාධිපතිවරයා සිය අභිමත බලය මෙලෙස සාධාරණ හෝ තර්කානුකූල පදනමකින් තොරව ක්‍රියාවට නැංවීමකි.

8. මෙම සිද්ධියේදී පැමිණිලිකරු නාවික හමුදා සේවයෙන් ඉවත් කිරීමට පාදක වී ඇත්තේ හුදෙක් පොලිසිය වෙතින් ලද පැමිණිල්ලක් පමණක් වන අතර, ඔහුට එරෙහිව වෙනත් කිසිදු විනය විරෝධී හැසිරීමක් හෝ වෘත්තීයමය අසමත් වීමක් පිළිබඳ කරුණු අනාවරණය නොවේ. නාවික හමුදා නීතිය ප්‍රකාරව, යම් සාමාජිකයෙකුට එරෙහිව විනය පියවර ගැනීම සඳහා 'ලඝු නඩු විභාගයක්' හෝ 'යුද්ධාධිකරණයක්' වැනි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වුව ද, මෙම සිදුවීමේදී වගඋත්තරකරුවන් එවැනි කිසිදු නීත්‍යානුකූල පටිපාටියක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ.

විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයකින් තොරව සහ තමාට එරෙහි චෝදනාවලට නිදහසට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී, හුදෙක් සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගැනීම පමණක් පදනම් කරගෙන 'සේවය තවදුරටත් අවශ්‍ය නොවේ' යන වගන්තිය යටතේ පුද්ගලයෙකු සේවයෙන් ඉවත් කිරීම අත්තනෝමතික ක්‍රියාවකි. විශේෂයෙන්ම, වසර 11 කට පසු පැමිණිලිකරු අධිකරණය හමුවේ පූර්ණ ලෙස නිදොස් කොට නිදහස් වූ පසුව පවා, මූලික අවස්ථාවේදී අනුගමනය නොකළ විධිමත් පටිපාටි හේතුවෙන් පැන නැගී ඇති පරිපාලනමය රික්තය සහ බාධාවන් මත එම සේවය අවසන් කිරීමේ තීරණය සංශෝධනය නොකිරීම

කිසිසේත් යුක්තිසහගත නොවේ. ඒ අනුව, නාවික හමුදාධිපතිවරයා විසින් සිය අභිමත බලය මෙලෙස සාධාරණ හෝ තාර්කික පදනමකින් තොරව ක්‍රියාවට නැංවීම තුළින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මඟින් සහතික කර ඇති 'නීතිය ඉදිරියේ සමානත්වය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ' මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇත.

## 06. නිගමනය

නාවික හමුදා සාමාජිකයෙකුට එරෙහිව කිසියම් පැමිණිල්ලක් හෝ චෝදනාවක් ඉදිරිපත් වූ අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් විධිමත් නඩු විභාගයක් පවත්වා දඬුවම් පැමිණවීම සඳහා ප්‍රධාන නෛතික ක්‍රමවේදයන් දෙකක් පවතී. ඉන් පළමුවැන්න 'ලඝු නඩු විභාගය' වන අතර, දෙවැන්න 'යුධාධිකරණයක්' වෙත ඉදිරිපත් කිරීමයි. සාමාන්‍ය පරිපාලන පටිපාටියට අනුව, පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලබන්නේ අදාළ සිදුවීම පිළිබඳ මූලික තොරතුරු විමර්ශනය කර ඒ හා බැඳුණු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පමණක් වන අතර, එහිදී යම් වරදක් අනාවරණය වන්නේ නම් ඉහත සඳහන් කළ නෛතික ක්‍රමවේදයන් දෙකෙන් එකක් අනුගමනය කරනු ලබයි.

මෙම සිදුවීමේදී වගඋත්තරකාර නාවික හමුදාව විසින් එවැනි කිසිදු විධිමත් පටිපාටියක් හෝ නීතිමය ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. වසර 11 ක දීර්ඝ කාලයකට පසුව පැමිණිලිකරු සිය විශ්‍රාම වැටුප් හා සේවා හිමිකම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන ඉල්ලීම නැවත සලකා බැලීම ප්‍රතික්ෂේප කිරීමට වගඋත්තරකාර පාර්ශවය උත්සාහ කරනුයේ, තමන් විසින් අනුගමනය කළ යුතුව තිබූ මූලික පරීක්ෂණයක් සිදු නොකිරීම තුළින් නැවත සලකා බැලීමේ පදනමක් නොමැතිවීමයි. මෙලෙස මූලික අවස්ථාවේදී නිසි නෛතික පටිපාටිය අනුගමනය නොකිරීම හේතුවෙන් පැන නැගී ඇති පරිපාලනමය රික්තය, පැමිණිලිකරුට හිමි සහනයන් ලබා දීමට ඇති බාධාවක් වීම තුළින් පැමිණිලිකරුගේ හිමිකම් නැවත සලකා බැලීමේ නෛතික හැකියාව ද අහිමි කර ඇති බව නිගමනය කරයි.

පැමිණිලිකරු සේවයෙන් ඉවත් කිරීමට පාදක වූ අපරාධ චෝදනාව වසර 11 ක දීර්ඝ නඩු විභාගයකින් පසු අනුරාධපුර මහාධිකරණය හමුවේ නිෂ්ප්‍රභ වී ඇති බැවින්, ඔහු එම වරද සම්බන්ධයෙන් නීතිය හමුවේ "නිවැරදිකරු" වේ. වගඋත්තරකාර නාවික හමුදාව සිය අභිමතය පරිදි පැමිණිලිකරුට සහන දීම ප්‍රතික්ෂේප කළ ද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් **S.C. (F.R.) 452/2011** නඩුවේදී ලබා දුන් තීන්දුව ප්‍රකාරව, කිසිදු රාජ්‍ය නිලධාරියෙකු සතු අභිමත බලය අසීමිත නොවන අතර එය නීතියේ පාලනයට යටත් විය යුතුය.

විධිමත් පරීක්ෂණයක් පවත්වා චෝදනා පත්‍රයක් නිකුත් කිරීමකින් තොරව, හුදෙක් පොලිසියෙන් ලද පැමිණිල්ලක් මත පමණක් පදනම්ව සේවය අවසන් කිරීමත්, ඉන් වසර 11 කට පසු පැමිණිලිකරු නිදොස් වූ පසුත් ඔහුට සහන ලබා නොදීමත් අතර්කානුකූල සහ අසාධාරණ ක්‍රියාවකි. ආයතනික රෙගුලාසියකින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් කටයුතු කිරීමට හැකියාවක් නොමැති බව නාවික හමුදාධිපතිවරයා අවධානයට ගත යුතුව ඇත.

ඒ අනුව වගඋත්තරකාර නාවික හමුදාව සිය අභිමතය තර්කානුකූල පදනමකින් තොරව ක්‍රියාවට නැංවීම තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති "නීතිය ඉදිරියේ සමානත්වය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

ඒ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කර සිටී.

1. පැමිණිලිකරුගේ වසර 17 ක සේවා කාලය සහ අධිකරණ නිදොස් කිරීම සැලකිල්ලට ගෙන, ඔහු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට නාවික හමුදාව පියවර ගත යුතුය.

2. ඒ අනුව පැමිණිලිකරුට හිමිවිය යුතු විශ්‍රාම වැටුප් හිමිකම්, හිඟ වැටුප් සහ පාරිතෝෂික දීමනාව ඇතුළු අනෙකුත් මූල්‍යමය ප්‍රතිලාභ ගණනය කර කඩිනමින් ලබා දීමට නාවික හමුදාව සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කටයුතු කළ යුතුය.

2026.07.02 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු( හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| පිටපත : | 1. | අමාත්‍යතුමා<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ - | කරුණු දැන ගැනීම සඳහා. |
| | 2. | නාවික හමුදාධිපති<br>ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය<br>කොළඹ - | නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා |
| | 3. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් -<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | සුදුසු පියවර ගැනීම සඳහා |